# වෙළෙඳාම සහ සංචාරක කර්මාන්තය

1990 දී, ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ අංශයේ වර්ධනයන් පසුගිය වර්ෂයට වඩා යහපත් විය. විගැහි වටිනාකම අනුව 1989 සියයට 11 ක වර්ධනය සමග සසඳන විට වෙළෙඳ භාණ්ඩ අපනයන වටිනාකම සියයට 20 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. අනෙක් අතට, 1989 සියයට 5 ක වැඩිවීම සමග සසඳන විට ආනයන වියදම සියයට 14 කින් වැඩිවිය. ඒ අනුව, වෙළෙඳ හිඟය 1988 වර්ෂයට වඩා සියයට 8 කින් අඩු වූ 1989 වර්ෂයේ පැවති මට්ටමෙහි ම රඳවාගත හැකි විය. අනෙක් අතට අපනයන ඉපයීම්, ආනයන වියදම්වල අනුපාතයක් වශයෙන් ගත්කල, එය 1989 දී සියයට 70 සිට 1990 දී සියයට 74 දක්වා සැළකිය යුතු පරිදි වැඩි විය.

1990 දී අපනයන ඉපැයීම්වල ඉහළ වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ තේ, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, රෙදිපිළි හා ඇඟළුම්. ඛනිජ තෙල් නිෂ්පාදිත, වෙනත් කාර්මික නිෂ්පාදිත සහ මැණික් වලින් ලද ඉපැයීම් වැඩිවීමය. මෙම අපනයනවල වූ වැඩිවීම්, රබර් සහ පොල් වැනි වෙනත් නිෂ්පාදිතයන්හි ඉපැයීම්වල වූ අඩුවීම් මුළුමනින්ම සමහන් කිරීමටත් වඩා ප්‍රමාණවත් විය.

තාවකාලික රේගු සංඛ්‍යාවලට අනුව 1990 වසරේ ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 105,559 ක් (විගැහි දශ ලක්ෂ 1,940) වූ අතර, අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 76,624 (විගැහි දශ ලක්ෂ 1,408) ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳ හිඟය රුපියල් දශ ලක්ෂ 28,935 (විගැහි දශ ලක්ෂ 532) ක් විය. කෙසේ වුවද, රේගු සංඛ්‍යා වාර්තා කිරීමේදී ඇති වන කල් පමාවීම් සහ අනෙකුත් සාධකවලට ගැලපීම් කළ පසු මුළු ආනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 107,729 (විගැහි දශ ලක්ෂ 1,980) ක් වූ අතර, අපනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 79,481 (විගැහි දශ ලක්ෂ 1,461) ක් විය. මෙසේ ගලපන ලද සංඛ්‍යාවලට අනුව, 1989 රුපියල් දශ ලක්ෂ 24,050 ක (විගැහි දශ ලක්ෂ 521) වෙළෙඳ හිඟය හා සසඳා බලන කළ 1990 දී රුපියල් දශ ලක්ෂ 28,248 (විගැහි දශ ලක්ෂ 519) ක වෙළෙඳ හිඟයක් පිළිබිඹු විය.

**1 . 36 සංඛ්‍යා සටහන**

**විදේශීය වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය 1988 – 1990**

| වර්ෂය | වර්ධන අනුපාතිකය | | වෙළෙඳ දර්ශක 1981 = 100 | | | අනුපාතය |
|---|---|---|---|---|---|---|
| | අපනයන | ආනයන | අපනයන මිළ | ආනයන මිළ | වෙළෙඳ අනුපාතය | අපනයන/ආනයන |
| 1988 .. .. | 1·7 | 4·5 | 165·8 | 157·0 | 105·6 | 0·66 |
| 1989 .. .. | 10·7 | 4·6 | 183·7 | 185·8 | 98·9 | 0·70 |
| 1990 (අ) .. .. | 20·1 | 14·0 | 234·6 | 262·7 | 89·3 | 0·74 |

(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා රේගුව;
ශ්‍රී ලංකා මහ බැංකුව.

පසුගිය වර්ෂය හා සසඳා බලන කල, 1990 දී රබර් හා පොල් හැරුණුවිට, අපනයනවල සාමාන්‍ය මිළ ගණන් යහපත් විය. අනෙක් අතට, තිරිඟු හා සහල් හැරුණු කල ඛනිජ තෙල්, පොහොර සහ සීනි වැනි ප්‍රධාන ආනයනයන්හි මිළ ගණන් 1989 ට වඩා සීඝ්‍රයෙන් වැඩිවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1990 දී වෙළෙඳ අනුපාතය සියයට 10 කින් පිරිහිණි.

## 1 . 37 සංඛ්‍යා සටහන

## අපනයන, ආනයන සහ වෙළෙඳ තුලනය 1979 – 1990

රුපියල් දශ ලක්ෂ (වරහන් තුළ විගැහි දශ ලක්ෂ)

| වර්ෂය | රේගු සංඛ්‍යා | | | ගලපන ලද සංඛ්‍යා | | |
|---|---|---|---|---|---|---|
| | අපනයන (අ) නැ.වි ස. | ආනයන (ආ) මි.ර.ගැ. | වෙළෙඳ තුලනය | අපනයන | ආනයන | වෙළෙඳ තුලනය |
| 1979 | 15.286<br>(760) | 22,560<br>(1,121) | – 7,275<br>( – 361) | 15.282<br>(759) | 22,603<br>(1,123) | – 7,321<br>( – 364) |
| 1980 | 17,388<br>(808) | 33,637<br>(1,563) | – 16 249<br>( – 755) | 17,595<br>(818) | 33,942<br>(1,577) | – 16,347<br>( – 760) |
| 1981 | 20,199<br>(891) | 35,530<br>(1,567) | – 15,331<br>( – 676) | 21,043<br>(928) | 36,583<br>(1,614) | – 15.540<br>( – 686) |
| 1982 | 21,124<br>(919) | 36.876<br>(1,605) | – 15.751<br>( – 686) | 21,454<br>(934) | 41,946<br>(1,826) | – 20,492<br>( – 892) |
| 1983 | 25,183<br>(1,001) | 42,021<br>(1,670) | – 16,838<br>( – 669) | 25,096<br>(998) | 45,558<br>(1,811) | – 20,461<br>( – 813) |
| 1984 | 37,006<br>(1,419) | 46.913<br>(1,799) | – 9,908<br>( – 380) | 37.347<br>(1,432) | 47,541<br>(1,823) | – 10,194<br>( – 391) |
| 1985 | 35,035<br>(1,268) | 49 069<br>(1,776) | – 14,034<br>( – 508) | 36,207<br>(1,311) | 54,049<br>(1,956) | – 17,843<br>( – 646) |
| 1986 | 34,092<br>(1,036) | 51.282<br>(1,559) | – 17,189<br>( – 523) | 34,072<br>(1,036) | 54,559<br>(1,658) | – 20,487<br>( – 623) |
| 1987 | 39,861<br>(1,046) | 59,750<br>(1,568) | – 19.889<br>( – 522) | 41.133<br>(1,080) | 60,528<br>(1,589) | – 19,396<br>( – 509) |
| 1988 | 47,092<br>(1,101) | 70,320<br>(1,645) | – 23,228<br>( – 543) | 46,928<br>(1,098) | 71,030<br>(1,661) | – 24.102<br>( – 564) |
| 1989 | 55,511<br>(1,202) | 75,353<br>(1,631) | – 19,842<br>( – 430) | 56,175<br>(1,216) | 80,225<br>(1,737) | – 24,050<br>( – 521) |
| 1990 | 76,624<br>(1,408) | 105,559<br>(1,940) | – 28,936<br>( – 532) | 79,481<br>(1,461) | 107,729<br>(1,980) | – 28.248<br>( – 519) |

(අ) ප්‍රති අපනයන වටිනාකම ඇතුළත්ය.
(ආ) ඝන රන් හා කාසි ඇතුළත් නොවේ.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව;
ශ්‍රී ලංකා මහ බැංකුව.

පරිවර්තනතාව : 1989 — විගැහි 1 = රු. 46·1874
1990 — විගැහි 1 = රු. 54·4216

### අපනයන

ගලපන ලද රේගු සංඛ්‍යාවලට අනුව, 1989 විගැහි දශ ලක්ෂ 1,216 (රුපියල් දශ ලක්ෂ 56,175) හා සසඳා බලන කල 1990 දී අපනයන වලින් ලද මුළු ඉපැයීම් විගැහි දශ ලක්ෂ 1,461 ක් (රුපියල් දශ ලක්ෂ 79,481) විය. මෙය විගැහි වටිනාකම අනුව සියයට 20 ක වැඩිවීමක් පෙන්වීය. මෙම වැඩි දියුණුවීම කෘෂිකාර්මික, කාර්මික සහ ඛනිජ අපනයන යන සියළුම අපනයන කාණ්ඩ තුළින් පිළිබිඹු විය. පසුගිය වර්ෂයේ සියයට 1 ක සුළු වැඩිවීම හා සසඳා බලන කල කෘෂිකාර්මික අපනයන ඉපැයීම් සියයට 11 කින් වැඩි විය. 1989 වසරේ සියයට 5 ක අඩුවීම හා සසඳන විට, 1990 දී ඛණිජ අපනයන වලින් ලද ඉපැයීම් ද සියයට 10 කින් වැඩි විය. මේ අතර, 1989 දී සියයට 16 කින් වැඩි වූ කාර්මික අපනයන 1990 දී සියයට 24 ක සිත් ගන්නා සුළු වර්ධනයක් වාර්තා කළේය.

## 1 . 38 සංඛ්‍යා සටහන

## අපනයන සංයුතිය 1988 – 1990

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු අපනයනවල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 | 1990(ඇ) | 1988 | 1989 | 1990 | 1988 | 1989 | 1990 |
| 1. කෘෂිකාර්මික අපනයන .. | 20,104 | 22,049 | 28,852 | 470 | 477 | 530 | 42·8 | 39·2 | 36·3 |
| 1·1 තේ .. | 12,299 | 13,664 | 19,823 | 288 | 296 | 364 | 26·2 | 24·3 | 24·9 |
| 1·2 රබර් .. | 3,706 | 3,112 | 3,080 | 87 | 67 | 57 | 7·9 | 5·5 | 3·9 |
| 1·3 පොල් .. | 1,538 | 2,865 | 2,783 | 36 | 62 | 51 | 3·3 | 5·1 | 3·5 |
| 1·3·1 පොල් මද නිෂ්පාදිත .. | 895 | 1,920 | 1,842 | 21 | 42 | 34 | 1·9 | 3·4 | 2·3 |
| 1·3·2 වෙනත් .. | 643 | 945 | 941 | 15 | 20 | 17 | 1·4 | 1·7 | 1·2 |
| 1·4 සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (අ) .. | 2,561 | 2,408 | 3,165 | 60 | 52 | 58 | 5·4 | 4·3 | 4·0 |
| 2. කාර්මික අපනයන (අ) (ආ) .. | 22,674 | 28,470 | 41,510 | 530 | 616 | 763 | 48·3 | 50·7 | 52·2 |
| 2·1 රෙදිපිළි හා ඇඟළුම් .. | 14,260 | 17,631 | 25,163 | 333 | 382 | 462 | 30·4 | 31·4 | 31·6 |
| 2·2 ඛනිජ තෙල් නිෂ්පාදිත .. | 2,265 | 2,242 | 3,974 | 53 | 49 | 73 | 4·8 | 4·0 | 5·0 |
| 2·3 වෙනත් .. | 6,148 | 8,597 | 12,374 | 144 | 186 | 227 | 13·1 | 15·3 | 15·5 |
| 3. ඛණිජමය අපනයන .. | 2,614 | 2,693 | 3,484 | 61 | 58 | 64 | 5·6 | 4·8 | 4·4 |
| 3·1 මැණික් .. | 2,070 | 2,204 | 2,933 | 48 | 48 | 54 | 4·4 | 3·9 | 3·7 |
| 3·2 වෙනත් .. | 543 | 489 | 551 | 13 | 11 | 10 | 1·2 | 0·9 | 0·7 |
| 4. වර්ග නොකළ අපනයන (ඇ) .. | 1,536 | 2,963(ඉ) | 5,635 | 36 | 64 | 104 | 3·3 | 5·3 | 7·1 |
| මුළු අපනයන (ආ) .. | 46,928 | 56,175 | 79,481 | 1,097 | 1,216 | 1,461 | 100·0 | 100·0 | 100·0 |

(අ) තෝරාගත් අයිතමයන්.
(ආ) ගලපන ලදී.
(ඇ) ප්‍රති අපනයන ඇතුළත්ය.
(ඈ) තාවකාලික.
(ඉ) නෞකාවක් අපනයනය ඇතුළත්ය.

පරිවර්තනතාවය :
1988 – විගැහි 1 = රුපියල් 42·7577
1989 – විගැහි 1 = රුපියල් 46·1874
1990 – විගැහි 1 = රුපියල් 54·4216

මූලයන් : ශ්‍රී ලංකා රේගුව;
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව;
සීමාසහිත එයාර් ලංකා;
ශ්‍රී ලංකා මහ බැංකුව.

1977 ආර්ථික ප්‍රතිසංස්කරණවලින් පසු සැළකිය යුතු පරිවර්තනයකට ලක්වූ අපනයන සංයුතිය 1990 දී මෙම වර්ධනයන් සමඟ තවදුරටත් වෙනස්වීම් පෙන්නුම් කළේය. මේ අතුරින්, කාර්මික අපනයන වලින් වූ දායකත්වය, 1989 හා 1990 කාලය තුළදී සියයට 51 සිට සියයට 52 දක්වා වැඩි වෙමින් ප්‍රධාන අපනයන අංශය වශයෙන් දිගටම පැවතුණි. මෙයට ප්‍රතිවිරුද්ධව, 1977 දී මුළු අපනයන ඉපැයීම් වලින් හතරෙන් තුනකට දායක වූ වැවිලි කෘෂිකාර්මික භෝගවල දායකත්වය, මෙම වර්ෂ දෙක තුළදී සියයට 35 සිට සියයට 32 දක්වා තවදුරටත් පහත වැටුණි. එසේම, ඛණිජ අපනයනවල දායකත්වය ද සියයට 5 සිට සියයට 4 දක්වා පහත වැටුණි. තනි භාණ්ඩයක් වශයෙන් 1986 දී විශාලතම අපනයන අංශය වූ රෙදිපිළි හා ඇඟළුම්වල දායකත්වය 1989 දී සියයට 31 සිට 1990 දී සියයට 32 දක්වා වැඩිකරමින් තවදුරටත් ප්‍රධාන අපනයන භාණ්ඩය වශයෙන් පැවතුණි.

**තේ**

1990 දී මුළු අපනයන වලින් සියයට 25 කට දායක වෙමින් තේ, තවදුරටත් ප්‍රධාන කෘෂිකාර්මික අපනයන නිෂ්පාදිතය වශයෙන් පැවතුණි. අපනයන ප්‍රමාණය සහ මිළ යන දෙකෙහිම වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් තේ අපනයන වටිනාකම 1989 විගැහි දශ ලක්ෂ 296 (රුපියල් දශ ලක්ෂ 13,664) සිට 1990 දී විගැහි දශ ලක්ෂ 364 (රුපියල් දශ ලක්ෂ 19,823) දක්වා සියයට 23 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. තේ අපනයන ප්‍රමාණය 1989 කිලෝග්‍රෑම් දශ ලක්ෂ 204 සිට 1990 කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 216 දක්වා සියයට 6 කින් වැඩි වූ අතර, සාමාන්‍ය අපනයන මිළද වර්ෂ දෙක තුළදී කිලෝග්‍රෑමයකට විගැහි 1.45 (කිලෝ ග්‍රෑමයකට රුපියල් 66.91) සිට කිලෝ ග්‍රෑමයකට විගැහි 1.69 (කිලෝ ග්‍රෑමයකට රුපියල් 91.78) දක්වා සියයට 17 කින් වැඩි විය. එමෙන්ම, කොළඹ වෙන්දේසියේ තේ වල සාමාන්‍ය මිළ ද කිලෝග්‍රෑමයකට රුපියල් 54.61 සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 70.91 දක්වා සියයට 30 කින් වැඩි විය. කෙසේ වුවද, මෙයට ප්‍රතිවිරුද්ධව, ලන්ඩන් වෙන්දේසියේ ශ්‍රී ලංකාවේ තේ සඳහා ලැබුණු සාමාන්‍ය මිළ වර්ෂ දෙක තුළදී කිලෝග්‍රෑමයකට පැන්ස 125.64 සිට කිලෝග්‍රෑමයකට පැන්ස 112.29 දක්වා සියයට 11 කින් පහත වැටුණි.

**රබර්**

රබර් අපනයන මිළ කිලෝග්‍රෑමයකට විගැහි 0.78 (කිලෝග්‍රෑමයකට රුපියල් 36.17) සිට කිලෝ ග්‍රෑමයකට විගැහි 0.65 (කිලෝග්‍රෑමයකට රුපියල් 35.50) දක්වා සියයට 17 කින් පහත වැටීම මුළුමනින්ම හේතුකොට ගෙන රබර් අපනයන වටිනාකම 1989 විගැහි දශ ලක්ෂ 67 (රුපියල් දශ ලක්ෂ 3,112) සිට 1990 දී විගැහි දශ ලක්ෂ 57 (රුපියල් දශ ලක්ෂ 3,080) දක්වා සියයට 15 කින් තවදුරටත් පහත වැටුණි. 1989 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 86 දක්වා සියයට 13 කින් පහත වැටුණු රබර් අපනයන ප්‍රමාණය, 1990 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 87 දක්වා සියයට 1 කින් සුළු වශයෙන් වැඩි විය. මුළු රබර් අපනයන ඉපැයීම් වලින්, ෂීට් රබර් සියයට 51 කට දායක වූ අතර, ලේටෙක්ස් ක්‍රෙප් සියයට 35 කට දායක විය. සෝල් ක්‍රෙප් සහ ස්ක්‍රැප් ක්‍රෙප් සියයට 6 බැගින් දායක විය.

**පොල්**

අපනයන ප්‍රමාණය ගෙඩි දශ ලක්ෂ 572 සිට ගෙඩි දශ ලක්ෂ 508 දක්වා සියයට 11 කින් පහත වැටීම නිසා පොල් නිෂ්පාදිත අපනයන වලින් ලද මුළු ඉපැයීම්, 1989 විගැහි දශ ලක්ෂ 62 (රුපියල් දශ ලක්ෂ 2,865) සිට 1990 දී විගැහි දශ ලක්ෂ 51 (රුපියල් දශ ලක්ෂ 2,783) දක්වා සියයට 18 කින් පහත වැටුණි. 1989 දී ප්‍රධාන පොල් නිෂ්පාදන ප්‍රදේශවල පැවති නියඟ තත්ත්වයන්හි පසුකාලීන බලපෑම නිසා නිෂ්පාදනය පහත වැටීම මෙයට හේතු විය. අනෙක් අතට, සාමාන්‍ය අපනයන මිළ ද පසුගිය වර්ෂයෙහි මෙන් ගෙඩියකට විගැහි 0.07 වශයෙන් නොවෙනස්ව පැවතුන නිසා මිළ උපනතීන් ද අපනයන ප්‍රමාණය පහත වැටීමෙන් ඇතිවූ අයහපත් ප්‍රතිඵල සමහන් කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය. ප්‍රධාන වශයෙන්ම පොල්කටු අඟුරු සහ කොහු කෙඳි අපනයන ඉපැයීම් අඩු වීම නිසා පොල් අතුරු නිෂ්පාදන අපනයන වටිනාකමද සුළු වශයෙන් පහත වැටුණි.

**සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත**

1990 දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අංශයේ ක්‍රියාකාරිත්වය වඩා යහපත් විය. මේවායේ අපනයන වටිනාකම 1989 විගැහි දශ ලක්ෂ 52 (රුපියල් දශ ලක්ෂ 2,408) සිට 1990 දී විගැහි දශ ලක්ෂ 58 (රුපියල් දශ ලක්ෂ 3,165) දක්වා සියයට 12 කින් වැඩි විය. කෙසේ වුවද, මුළු අපනයනවල සුළු කෘෂිකාර්මික නිෂ්පාදිතයන්හි දයකත්වය පසුගිය වර්ෂයේ මෙන් සියයට 4 ක මට්ටමෙහි නොවෙනස්ව පැවතුණි. මේවා අතුරින් එළවළු, කරාබු නැටි, දුම්කොල, තල ඇට සහ කජු මද අපනයන වලින් ලද ඉපැයීම්වල සැළකිය යුතු වැඩිවීම් වාර්තා විය. මුළු සුළු කෘෂිකාර්මික නිෂ්පාදිතවලට කුරුඳුවලින් වූ දයකත්වය පමණක් සියයට 38 ක් විය.

**කාර්මික අපනයන**

1989 විගැහි දශ ලක්ෂ 616 (රුපියල් දශ ලක්ෂ 28,470) හා සසඳා බලන කල 1990 දී කාර්මික අපනයනවල වටිනාකම සියයට 24 ක වැඩිවීමක් වාර්තා කරමින් විගැහි දශ ලක්ෂ 763 (රුපියල් දශ ලක්ෂ 41,510) ක් විය. මෙය පසුගිය වර්ෂයේ සියයට 16 ක වර්ධනය හා සැසඳිය හැකිය. මෙම ඉහළ වර්ධන අනුපාතිකය, රෙදිපිළි හා ඇහලුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ වෙනත් කාර්මික නිෂ්පාදිත යන සියළුම වර්ගයේ කාර්මික නිෂ්පාදිතයන්හි පිළිබිඹු විය. වර්ෂ දෙක ඇතුළත දී රෙදිපිළි හා ඇහලුම් අපනයන විගැහි දශ ලක්ෂ 382 සිට විගැහි දශ ලක්ෂ 462 දක්වා සියයට 21 කින් වැඩි විය. ප්‍රධාන වශයෙන්ම, ගල්ෆ් අර්බුදය නිසා ඛනිජ තෙල් මිළ ගණන් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඛනිජ තෙල් අපනයන වටිනාකම විගැහි දශ ලක්ෂ 49 සිට විගැහි දශ ලක්ෂ 73 දක්වා සියයට 49 කින් වැඩි විය. රසායනික නිෂ්පාදිත, සම් හා රබර් නිෂ්පාදිත සහ මුහුදු නිෂ්පාදිතයන්හි වැඩි වූ ඉපැයීම් පිළිබිඹු කෙරෙමින් වෙනත් කාර්මික නිෂ්පාදිතයන්හි වටිනාකම ද සියයට 22 කින් වැඩි විය.

**ඛනිජමය අපනයන**

පසුගිය වර්ෂයේ පසුබෑමකට ලක්වූ ඛනිජ අපනයන විගැහි දශ ලක්ෂ 58 (රුපියල් දශ ලක්ෂ 2,693) සිට විගැහි දශ ලක්ෂ 64 (රුපියල් දශ ලක්ෂ 3,484) දක්වා සියයට 10 කින් වැඩිවිය. මෙයට මුළුමනින්ම හේතු වූයේ අපනයන ප්‍රමාණය වැඩිවීම නිසා මැණික් අපනයනවලින් ලද ඉපැයීම් විගැහි දශ ලක්ෂ 48 (රුපියල් දශ ලක්ෂ 2,204) සිට විගැහි දශ ලක්ෂ 54 (රුපියල් දශ ලක්ෂ 2,933) දක්වා සියයට 13 කින් ඉහළ යාමය. ජපානය, තායිලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ හොංකොං යන රටවල් මැණික් අපනයන සඳහා ප්‍රධාන වෙළෙඳපලවල් විය. ලෝපස්, යකඩ පයිරයිට්ස් සහ ස්වාභාවික මිනිරන් ඇතුළත් වෙනත් ඛනිජ අපනයනවල වටිනාකම විගැහි දශ ලක්ෂ 11 සිට විගැහි දශ ලක්ෂ 10 දක්වා සුළු වශයෙන් පහත වැටුණි.

**ආනයන**

ගලපන ලද රේගු සංඛ්‍යා වලට අනුව, 1989 විගැහි දශ ලක්ෂ 1,737 (රුපියල් දශ ලක්ෂ 80,225) හා සසඳා බලන කල 1990 දී මුළු ආනයන වියදම සියයට 14 ක වැඩිවීමක් පෙන්වමින් විගැහි දශ ලක්ෂ 1,980 (රුපියල් දශ ලක්ෂ 107,729) ක් විය. මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන්ම තිරිඟු පිටි, මෝටර් කාර් හා බයිසිකල් වැනි පාරිභෝගික භාණ්ඩ තුළින් ද, ඛනිජ තෙල් සහ පොහොර යන අන්තර් භාණ්ඩ තුළින්ද, ප්‍රවාහන උපකරණ හා යන්ත්‍රසූත්‍ර වැනි ආයෝජන භාණ්ඩ තුළින්ද, පිළිබිඹු විය.

1990 දී ආනයන සංයුතිය වෙනස් වූයේ සුළු වශයෙන් පමණි. 1989 දී මෙන් පාරිභෝගික භාණ්ඩවල දයකත්වය සියයට 26 ක මට්ටමෙහි නොවෙනස්ව පැවති අතර, අන්තර් භාණ්ඩවල දයකත්වය සියයට 56 සිට සියයට 54 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. කෙසේ වුවද, වර්ෂ දෙක ඇතුළතදී, ආයෝජන භාණ්ඩවල දයකත්වය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි විය.

## 1 . 39 සංඛ්‍යා සටහන

## ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව කෙරෙන වර්ගීකරණය 1988 – 1990

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | වටිනාකම විශේෂ ගැනීම දශ ලක්ෂ | | | මුළු ආනයනවල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 (අ) | 1990 (ආ) | 1988 | 1989 | 1990 | 1988 | 1989 | 1990 |
| 1. පාරිභෝගික භාණ්ඩ .. | 17,438 | 20,962 | 28,004 | 407·8 | 453·8 | 514·6 | 24·5 | 26·1 | 26·0 |
| 1.1 ආහාර සහ පාන වර්ග . | 10,214 | 13,136 | 16,566 | 238·9 | 284·4 | 304·4 | 14·4 | 16·4 | 15·4 |
| 1.1.1 සහල් .. | 1,808 | 3,397 | 1,758 | 42·3 | 73·5 | 32·3 | 2·6 | 4·2 | 1·6 |
| 1.1.2 පිටි . | 303 | 175 | 1,388 | 7·1 | 3·8 | 25·5 | 0·4 | 0·2 | 1·3 |
| 1.1.3 සීනි . | 2,927 | 4,326 | 5,173 | 68·5 | 93·7 | 95·1 | 4·1 | 5·4 | 4·8 |
| 1.2 වෙනත් . | 7,225 | 7,826 | 11,438 | 169·0 | 169·4 | 210·2 | 10·2 | 9·8 | 10·6 |
| 2. අන්තර් භාණ්ඩ . | 40,325 | 45,255 | 58,672 | 943·1 | 979·8 | 1,078·1 | 56·8 | 56·4 | 54·5 |
| 2.1 ඛණිජ තෙල් .. | 7,839 | 8,376 | 14,367 | 183·3 | 181·3 | 264·0 | 11·0 | 10·4 | 13·3 |
| 2.2 පොහොර . | 2,476 | 1,755 | 2,958 | 57·9 | 38·0 | 54·4 | 3·5 | 2·2 | 2·7 |
| 2.3 රසායනික ද්‍රව්‍ය . | 1,887 | 2,117 | 3,259 | 44·1 | 45·8 | 60·0 | 2·6 | 2·6 | 3·0 |
| 2.4 තිරිඟු . | 2,800 | 4,964 | 3,791 | 65·5 | 107·5 | 69·7 | 3·9 | 6·2 | 3·5 |
| 2.5 රෙදිපිළි හා ඇඟළුම් (ඈ) . | 8,796 | 9,981 | 10,977 | 205·7 | 216·0 | 201·7 | 12·4 | 12·4 | 10·2 |
| 3. ආයෝජන භාණ්ඩ . | 12,081 | 12,018 | 19,129 | 282·5 | 260·2 | 351·5 | 17·0 | 15·0 | 17·8 |
| 3.1 යන්ත්‍ර සූත්‍ර හා උපකරණ . | 7,047 | 6,278 | 8,659 | 164·8 | 135·9 | 159·1 | 9·9 | 7·8 | 8·0 |
| 3.2 ගමනාගමන උපකරණ . | 1,409 | 1,833 | 3,577 | 32·9 | 39·7 | 65·7 | 2·0 | 2·3 | 3·3 |
| 3.3 ගොඩනැගිලි ද්‍රව්‍ය . | 1,038 | 991 | 1,043 | 24·3 | 21·5 | 19·2 | 1·5 | 1·2 | 1·0 |
| 4. වර්ග නොකරන ලද . | 1,186 | 1,990 | 1,923 | 27·7 | 43·1 | 35·3 | 1·7 | 2·5 | 1·7 |
| මුළු ආනයන (ඇ) .. | 71,030 | 80,225 | 107,729 | 1,661·2 | 1,736·9 | 1,979·5 | 100·0 | 100·0 | 100·0 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) ගලපන ලදී.
(ඈ) ඉහතදී පාරිභෝගික භාණ්ඩ වශයෙන් වර්ග කරන ලද රෙදිපිළි හා ඇඟළුම් ආනයන දැන් අන්තර් භාණ්ඩ වශයෙන් වර්ග කනු ලැබේ.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව;
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව;
සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව;
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන පොහොර ආනයන කරුවෝ;
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව;
ශ්‍රී ලංකා මහ බැංකුව.

**පාරිභෝගික භාණ්ඩ**

ආහාර හා පාන වර්ග සහ වෙනත් පරිභෝජන භාණ්ඩ යන දෙවර්ගයම සඳහා වූ වියදම වැඩිවීම නිසා පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම, 1989 විගැහි දශ ලක්ෂ 454 (රුපියල් දශ ලක්ෂ 20,962) සිට 1990 දී විගැහි දශ ලක්ෂ 515 (රුපියල් දශ ලක්ෂ 28,004 දක්වා සියයට 13 කින් වැඩිවිය. ආහාර හා පාන වර්ග ඛණ්ඩයේ ඇතුළත්, තිරිඟු පිටි ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 17,025 සිට මෙට්‍රික් ටොන් 128,736 දක්වා අට ගුණයකින් වැඩිවීම නිසා තිරිඟු පිටි සඳහා වූ ආනයන වියදම විගැහි දශ ලක්ෂ 4 (රුපියල් දශ ලක්ෂ 175) සිට විගැහි දශ ලක්ෂ 26 (රුපියල් දශ ලක්ෂ 1,388) දක්වා හත් ගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි විය. එසේ වුවද, සහල් ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 315,959 සිට මෙට්‍රික් ටොන් 171,962 දක්වා තියුණු ලෙස පහත වැටීම නිසා වර්ෂ දෙක ඇතුළතදී සහල් ආනයන වියදම විගැහි දශ ලක්ෂ 74 (රුපියල් දශ ලක්ෂ 3,397) සිට විගැහි දශ ලක්ෂ 32 (රුපියල් දශ ලක්ෂ 1,758) දක්වා සියයට 56 කින් තියුණු ලෙස පහත වැටුණි. මේ අතර, සීනි ආනයන වියදම විගැහි දශ ලක්ෂ 94 (රුපියල් දශ ලක්ෂ 4,326) සිට විගැහි දශ ලක්ෂ 95 (රුපියල් දශ ලක්ෂ 5,173) දක්වා සුළු වශයෙන් වැඩි විය. මෙයට මුළුමනින්ම හේතු වූයේ ආනයන මිළ මෙට්‍රික් ටොන් එකක් විගැහි 292 සිට විගැහි 311 දක්වා සියයට 7 කින් වැඩි වීමය. මෙයට ප්‍රතිවිරුද්ධව, වර්ෂ දෙක තුළදී ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 320,403 සිට මෙට්‍රික් ටොන් 305,324 දක්වා සියයට 5 කින් අඩු විය. දෙවර්ෂය තුළ ප්‍රධාන වශයෙන්ම, මෝටර් රථ හා මෝටර් බයිසිකල් ආනයන වියදම විගැහි දශ ලක්ෂ 62 (රුපියල් දශ ලක්ෂ 2,886) සිට විගැහි දශ ලක්ෂ 80 (රුපියල් දශ ලක්ෂ 4,330) දක්වා සියයට 29 කින් වැඩිවීම නිසා වෙනත් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම විගැහි දශ ලක්ෂ 169 (රුපියල් දශ ලක්ෂ 7,826) සිට විගැහි දශ ලක්ෂ 210 (රුපියල් දශ ලක්ෂ 11,438) දක්වා සියයට 24 කින් වැඩි විය.

**අන්තර් භාණ්ඩ**

1989 විගැහි දශ ලක්ෂ 980 (රුපියල් දශ ලක්ෂ 45,255) හා සසඳා බලන කළ 1990 දී අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 10 ක වැඩිවීමක් වාර්තා කරමින් විගැහි දශ ලක්ෂ 1,078 (රුපියල් දශ ලක්ෂ 58,672) ක් විය. මෙයට වැඩි වශයෙන්ම හේතු වූයේ ඛණිජ තෙල්, පොහොර, රසායනික ද්‍රව්‍ය සහ කඩදාසි නිෂ්පාදිත සඳහා වූ ආනයන වියදම් වැඩිවීමය. ප්‍රධාන වශයෙන්ම ගල්ෆ් අර්බුදය නිසා මිළ ගණන් වැඩිවීමේ හේතුවෙන් ඛණිජ තෙල් ආනයන වියදම විගැහි දශ ලක්ෂ 181 (රුපියල් දශ ලක්ෂ 8,376) සිට විගැහි දශ ලක්ෂ 264 (රුපියල් දශ ලක්ෂ 14,367) දක්වා සියයට 46 කින් තියුණු ලෙස වැඩිවිය. ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 354,900 සිට මෙට්‍රික් ටොන් 504,669 දක්වා සියයට 42 කින් විශාල වශයෙන් වැඩිවීම නිසා පොහොර ආනයන වියදම ද විගැහි දශ ලක්ෂ 38 (රුපියල් දශ ලක්ෂ 1,755) සිට විගැහි දශ ලක්ෂ 54 (රුපියල් දශ ලක්ෂ 2,958) දක්වා සියයට 43 කින් තියුණු ලෙස ඉහළ නැගුණි. රසායනික නිෂ්පාදිත ආනයන වියදම විගැහි දශ ලක්ෂ 46 (රුපියල් දශ ලක්ෂ 2,117) සිට විගැහි දශ ලක්ෂ 60 (රුපියල් දශ ලක්ෂ 3,259) දක්වා සියයට 31 කින් වැඩි වූ අතර, කඩදාසි සහ ඝන කඩදාසි නිෂ්පාදිත ආනයන වියදම විගැහි දශ ලක්ෂ 39 (රුපියල් දශ ලක්ෂ 1,813) සිට විගැහි දශ ලක්ෂ 54 (රුපියල් දශ ලක්ෂ 2,947) දක්වා සියයට 38 කින් තියුණු ලෙස ඉහළ නැගුණි.

මෙම වැඩිවීම්, තිරිඟු ඇට සහ රෙදිපිළි ආනයන වියදම්වල වූ අඩුවීම් සමහන් කිරීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා අධික විය. මිළ මෙන්ම ප්‍රමාණය විශාල වශයෙන් අඩුවීම නිසා තිරිඟු පිටි ආනයන වියදම 1989 විගැහි දශ ලක්ෂ 108 (රුපියල් දශ ලක්ෂ 4,964) සිට 1990 දී විගැහි දශ ලක්ෂ 70 (රුපියල් දශ ලක්ෂ 3,791) දක්වා සියයට 35 කින් තියුණු ලෙස අඩු විය. ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 726,036 සිට මෙට්‍රික් ටොන් 576,611 දක්වා සියයට 21 කින් අඩු වූ අතර, ආනයන මිළ මෙට්‍රික් ටොන් එකක් විගැහි 148 සිට විගැහි 121 දක්වා සියයට 18 කින් අඩු විය. තිරිඟු පිටි ආනයන ප්‍රමාණය වැඩිවීම තිරිඟු ඇට ආනයන ප්‍රමාණය පහත

වැටීම සඳහා විශාල වශයෙන් දායක විය. රෙදිපිළි හා ඇඟළුම් ආනයන වියදම විගැහි දශ ලක්ෂ 216 (රුපියල් දශ ලක්ෂ 9,981) සිට විගැහි දශ ලක්ෂ 202 (රුපියල් දශ ලක්ෂ 10,977) දක්වා සියයට 6 කින් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මිළ ගණන් අඩුවීමය.

**1 . 40 සංඛ්‍යා සටහන**

**1990 වර්ෂයේ ප්‍රධාන ආනයනයන්හි පරිමාව**

මෙට්‍රික් ටොන්

| මාසය | සහල් | තිරිඟු | සීනි | ඛනිජ තෙල් (බොර තෙල්) | පොහොර |
|---|---|---|---|---|---|
| ජනවාරි .. | 23,173 | 31,500 | 17,243 | 128,192 | 14,431 |
| පෙබරවාරි .. | 38,450 | — | 11,501 | 183,693 | 37,229 |
| මාර්තු .. | 8,798 | 149,514 | 39,191 | — | 79,308 |
| අප්‍රේල් .. | 31 | 100,814 | 17,006 | 127,013 | 52,235 |
| මැයි .. | 21,051 | 49,412 | 34,164 | 189,724 | 23,449 |
| ජූනි .. | 46 | — | 18,083 | 126,576 | 15,576 |
| ජූලි .. | 19,269 | 36,750 | 30,420 | 184,994 | 12,610 |
| අගෝස්තු .. | 10,029 | 104,475 | 27,022 | 108,851 | 50,550 |
| සැප්තැම්බර් .. | 16 | — | 36,235 | 184,202 | 31,200 |
| ඔක්තෝබර් .. | 22,553 | 35,200 | 18,780 | 177,317 | 67,134 |
| නොවැම්බර් .. | 25,049 | — | 30,448 | 185,647 | 50,900 |
| දෙසැම්බර් .. | 3,497 | 68,946 | 25,226 | 182,657 | 70,047 |
| එකතුව (අ) .. | 171,962 | 576,611 | 305,324 | 1,778,866 | 504,669 |

(අ) ගලපන ලදී.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව;
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව;
සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව;
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව;
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන පොහොර ආනයනකරුවෝ.

**ආයෝජන භාණ්ඩ**

ආයෝජන භාණ්ඩ ආනයන වියදම 1989 විගැහි දශ ලක්ෂ 260 (රුපියල් දශ ලක්ෂ 12,018) සිට 1990 දී විගැහි දශ ලක්ෂ 352 (රුපියල් දශ ලක්ෂ 19,129) දක්වා සියයට 35 කින් වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර ආනයන වියදම් වැඩිවීම ය. ප්‍රවාහන උපකරණ ආනයන වටිනාකම විගැහි දශ ලක්ෂ 40 (රුපියල් දශ ලක්ෂ 1,833) සිට විගැහි දශ ලක්ෂ 66 (රුපියල් දශ ලක්ෂ 3,577) දක්වා සියයට 65 කින් වැඩි වූ අතර යන්ත්‍රසූත්‍ර ආනයන වටිනාකම විගැහි දශ ලක්ෂ 136 (රුපියල් දශ ලක්ෂ 6,278) සිට විගැහි දශ ලක්ෂ 159 (රුපියල් දශ ලක්ෂ 8,659) දක්වා සියයට 17 කින් වැඩිවිය. කෙසේ වුවද, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වටිනාකම විගැහි දශ ලක්ෂ 22 (රුපියල් දශ ලක්ෂ 991) සිට විගැහි දශ ලක්ෂ 19 (රුපියල් දශ ලක්ෂ 1,043) දක්වා සියයට 14 කින් පහත වැටුණි.

**අභ්‍යන්තර වෙළෙඳාම**

1977 නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිවලින් පසු අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තියෙහි අරමුණ වූයේ වෙළෙඳ කටයුතු මෙහෙයවීමේදී වෙළෙඳපොල බලවේගයන්ට වැඩි කාර්යභාරයක් ලබාදීමය. ඒ අනුව සාධාරණ තරඟකාරිත්වයක් නංවාලීම සඳහා රජයේ මැදිහත්වීම අවම කෙරෙමින් භාණ්ඩ හා සේවාවන්හි තොග හා සිල්ලර වෙළෙඳ කටයුතුවල පුද්ගලික අංශයේ සහභාගිත්වය දිරි ගන්වන ලදී.

1987 දී පිහිටුවන ලද සාධාරණ වෙළෙඳ කොමිසම විසින් ජාතික මිළ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ වගකීමට අමතරව ඒකාධිකාරයන්, ඒකාබද්ධවීම් සහ තරඟකාරීත්වයට එරෙහි කටයුතු පාලනය කිරීම හා සම්බන්ධ කාර්‍යයන්හි නිරත විණි. මෙම කොමිසම විසින් පසුගිය වසරේ කරන ලද මිළ විවරණ 161 හා සසඳන විට, විමර්ශනයට ලක්ව ඇති වසර තුළදී මිළ විවරණ 89 ක් සිදු කරන ලදී. මෙම මිළ විවරණ වලින් අරමුණු වූයේ පාරිභෝගිකයාගේ මෙන්ම නිෂ්පාදකයාගේ ද අයිතීන් ආරක්ෂා කිරීමය. පසුගිය වර්ෂවලදී මෙන්ම මහපොළ වෙළෙඳ පොලවල් සහ පාරිභෝගික සමිති සංවිධානය කිරීම මගින් පාරිභෝගිකයන්ගේ දැනුවත්කම වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු විය. ඒ අනුව නව පාරිභෝගික සමිති 1,042 ක් ඇති කරන ලද අතර තවත් සමිති 734 ක් 1990 දී ප්‍රතිසංවිධානය කරන ලදී. වර්ෂය තුළදී කළුතර සහ මීගමුවෙහි මහපොළ වෙළෙඳ පොළවල් දෙකක් පවත්වන ලදී.

සමස්තයක් වශයෙන් ගත් කළ රාජ්‍ය වෙළෙඳ සංවිධානයන් විසින් නිදහස් වෙළෙඳ ප්‍රතිපත්ති රාමුවක් ඇතුළත සිය අරමුණු ව්‍යිමත් කිරීමට උත්සාහ දරන ලද අතර පුද්ගලික අංශය සමඟ කාර්‍යක්ෂමව තරඟ කිරීම සඳහා වඩා ගතික ආකල්පයක් දිගටම පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. වෙළෙඳ පොළෙහි ප්‍රමාණවත් සැපයුමක් සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් සම්භාරක තොග පවත්වාගෙන යාමේ වැදගත් වගකීම සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) විසින් දිගටම කරගෙන යන ලදී. කලින් ආහාර කොමසාරිස් විසින් කරගෙන යන ලද තිරිඟු ඇට, තිරිඟු පිටි සහ සහල් ආනයනයද 1989 අගෝස්තු මස සිට සතොස විසින් කරගෙන යන ලදී.

**විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය**

1977 ඇති කරන ලද නිදහස් වෙළෙඳ ප්‍රතිපත්ති, තීරුබදු සහ අපනයන/ආනයන නීතිවල සුළු වෙනස්කම් පමණක් සහිතව 1990 දී ද දිගටම ක්‍රියාත්මක විණි.

**තීරුබදු**

1990 අපනයන තීරුබදුවල සැළකිය යුතු වෙනස්කම් ඇති නොවීය. 1988 නොවැම්බර් මස ප්‍රතිශෝධනය කරන ලද තේ අපනයන බද්ද විමර්ශනයට ලක්ව ඇති වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුණි. මෙසේ තොග තේ, පැකට් කළ තේ, තේ මළු, ක්ෂණික තේ සහ අනෙක් සියළුම තේ වර්ග සඳහා අදාළ වූ බදු ප්‍රමාණයන් කිලෝග්‍රෑමයකට රු. 1.50, රු. 1.00, ශත 50, රු. 6.50 සහ රු. 3.50 වශයෙන් පැවතුණි. කෙසේ වුවද, තේ වල විකුණුම් වටිනාකම අනුව අය කරන බද්දෙහි අවම සීමා මිළ 1990 ජූලි මාසයේ දී ප්‍රතිශෝධනය කරන ලදී. ඒ අනුව බදු අය කෙරෙන මිළ කිලෝග්‍රෑමයකට රුපියල් 60 සිට රුපියල් 65 දක්වා ඉහළ නැංවූ අතර, රුපියල් 15 ක උපරිමයකට යටත්ව බදු අනුපාතිකය අවම සීමා මිළට වැඩි මුදලින් සියයට 50 ක් වශයෙන් පැවැත්විණි. මීට අමතරව තේ අපනයන සෙස් බද්ද ද, 1990 අප්‍රේල් මස සිට කිලෝග්‍රෑමයකට රුපියල් 2.00 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 3.50 දක්වා වැඩි කරන ලදී.

**ආනයන හා අපනයන පාලන**

කෘතිම රේසින් වර්ග, ප්ලාස්ටික් ද්‍රව්‍ය, සෙලියුලෝස් වර්ග සහ උදළු, පාලන නීති වලින් නිදහස් කරන ලද අතර, අවුරුදු තුනකට වඩා පැරණි මෝටර් සයිකල්, ඔටෝ සයිකල්, ත්‍රිරෝද රථ සහ ඔටෝ ත්‍රිරෝද රථ ආනයනය, ආනයන පාලන බලපත් යටතට ගෙන එන ලදී. ආසන 30 හෝ ඊට වැඩි බස් රථවල වයස් සීමාව අවුරුදු 5 සිට 10 දක්වා ලිහිල් කර ආනයනය සඳහා අවසර දෙන ලදී. අපනයන පාලනයන් සම්බන්ධයෙන් 1990 දී කිසිදු වෙනසක් සිදු නොවීය.

## වෙළෙඳ ගිවිසුම්

ආනයන හා අපනයන රටවල සියයට 80 ක අනුමැතිය සමඟ 1989 අප්‍රේල් මස සිට නිල වශයෙන් ක්‍රියාත්මක වූ ජාත්‍යන්තර ස්වාභාවික රබර් ගිවිසුමට ශ්‍රී ලංකාව විසින් 1990 අගෝස්තු මස අත්සන් තබන ලදී. යෝජිත ජාත්‍යන්තර තේ ගිවිසුම සම්බන්ධයෙන් 1990 වර්ෂයේදී ද කිසිම ප්‍රගතියක් දක්නට නොලැබුණි. ප්‍රධාන කෝපි නිෂ්පාදන රටවලට සහ ආනයනය කරනු ලබන රටවලට, නව ගිවිසුමේ කොන්දේසි පිළිබඳව එකඟත්වයකට එළඹීමට අපොහොසත් වූ නිසා 1989 සැප්තැම්බර් මස අවලංගු වූ ජාත්‍යන්තර කෝපි ගිවිසුම 1989 ඔක්තෝබර් මස සිට තවත් අවුරුදු දෙකක කාලසීමාවකට දීර්ඝ කරන ලදී. 1989 ජුලි මස අත්හිටුවන ලද කෝපි සලාකයන් 1990 වර්ෂයේ ද එසේම පැවතිණි.

1990 නොවැම්බර් මස පාර්ලිමේන්තුව මගින් ආදයම් ආරක්ෂණ පණතක් සම්මත කිරීමෙන් රජය විසින් 1989 සිට ක්‍රියාත්මක වූ ලෝක වරණීය වෙළෙඳ ක්‍රම ගිවිසුම සඳහා නීත්‍යානුකූල භාවයක් ලබාදෙන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වූයේ වෙළෙඳ වරණයන් හුවමාරුව මගින් සංවර්ධනය වන රටවල වෙළෙඳාම නංවාලීම ය. මුලින්ම 1976 දී අත්සන් තබන ලද බැංකොක් ගිවිසුම 1990 මැයි මස යළි ආරම්භ කරන ලද 4 වන සැසි වාරයේ දී අවසන් කරන ලදී. මෙම සැසි වාරයේ දී ශ්‍රී ලංකාවට අපනයන සම්බන්ධයෙන් වැදගත් වූ භාණ්ඩ 60 කට වැඩි ප්‍රමාණයකට බංගලාදේශය, ඉන්දියාව සහ දකුණු කොරියාව වැනි වෙනත් සාමාජික රටවලින් සහනදායී තීරුබදු අනුපාතිකයන් ලබාගත හැකි විය.

## සංචාරක කර්මාන්තය

1983 සිවිල් කලබල ඇති වූ අවස්ථාවේ සිට පහත වැටීමේ උපනතියකට මුහුණ පා සිටි සංචාරක කර්මාන්තය රටේ ආරක්ෂක තත්ත්වය වැඩි දියුණුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1990 දී සැළකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළේය. 1990 වර්ෂයේ 297,888 ක් වූ මුළු සංචාරක පැමිණීම් 1989 ට වඩා සියයට 61 ක වැඩිවීමක් වාර්තා කළේය. විමර්ශණයට ලක්ව ඇති වර්ෂය තුළදී සංචාරකයින් විසින් ගත කරන ලද රාත්‍රී සංඛ්‍යාව 3,068,264 ක් වෙමින් සියයට 56 ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කළේය.

**1 . 41 සංඛ්‍යා සටහන**

**සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛන 1989 – 1990**

| ශීර්ෂය | 1989 | 1988ට වඩා ප්‍රතිශත වෙනස | 1990 | 1989ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් .. | 184,732 | + 1·1 | 297,888 | + 61·3 |
| 2. පැය 24 ට අඩු කාලයකට රට තුළ රැඳෙන විදේශික මගීන්ගේ පැමිණීම් .. | 4,064 | – 33·5 | 3,954 | – 2·7 |
| 3. සංචාරක දින (රාත්‍රී) ගණන (දහස්) .. | 1,970 | – 14·5 | 3,068 | + 55·7 |
| 4. සංචාරකයින්ගෙන් දළ ලැබීම් | | | | |
| 4·1 රුපියල් දශ ලක්ෂ .. | 2,739·7 | + 12·4 | 4,800·0(අ) | + 75·2 |
| 4·2 එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ .. | 76·0 | – 0·8 | 120·0 | + 57·9 |
| 4·3 විශේෂ දශ ලක්ෂ .. | 59·3 | + 4·0 | 88·2 | + 48·7 |
| 5. පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින්ගේ ගණන | | | | |
| 5·1 විනෝදය .. | 170,170 | + 3·1 | 277,722 | + 63·2 |
| 5·2 ව්‍යාපාරික කටයුතු .. | 11,774 | – 13·9 | 15,250 | + 29·5 |
| 6. කලාප අනුව පැමිණි ගණන | | | | |
| 6·1 බටහිර යුරෝපය .. | 101,910 | – 8·5 | 169,294 | + 66·1 |
| 6·2 ආසියාව .. | 65,428 | + 21·8 | 100.004 | + 52·8 |
| 6·3 උතුරු ඇමෙරිකාව .. | 5,844 | – 10·6 | 8,084 | + 38·3 |
| 7. මුළු සේවා නියුක්තිය .. | 48,000 | + 1·6 | 60,000(අ) | + 25·0 |
| 7·1 සෘජු .. | 20,000 | + 1·6 | 25,000 | + 25·0 |
| 7·2 වක්‍ර .. | 28,000 | + 1·6 | 35,000 | + 25·0 |

(අ) තාවකාලික.

මූලය : ලංකා සංචාරක මණ්ඩලය.

1990 වර්ෂයේදී සියළුම ප්‍රධාන කලාපයන්ගෙන් වූ සංචාරක පැමිණීම් සැළකිය යුතු වර්ධනයක් පෙන්විය. පසුගිය වර්ෂයේ සියයට 55 හා සසඳා බලන කල මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 57 කට දයක වූ බටහිර යුරෝපය විසින් අතීතයේ මෙන්ම ප්‍රධාන වෙළෙඳපොල වශයෙන් සිය ස්ථානය පවත්වා ගන්නා ලදී. 1990 දී 169,294 ක් වූ බටහිර යුරෝපයෙන් වූ සංචාරක පැමිණීම් 1989 ට වඩා සියයට 66 ක සිත්ගන්නා සුළු වර්ධනයක් වාර්තා කළේය. දෙවන විශාලම වෙළෙඳපොළ වූ ආසියාතු වෙළෙඳපොලින් සංචාරක පැමිණීම්, ඉන්දුනිසියාව, ජපානය හා හොංකොං වලින් පැමිණි සංචාරකයින්ගේ වැඩිවීම් පිළිබිඹු කෙරෙමින් සියයට 53 කින් වැඩි විය. ඕස්ට්‍රලේසියාවෙන් සහ නැගෙනහිර යුරෝපයෙන් සංචාරක පැමිණීම් පිළිවෙලින් සියයට 122 කින් හා 66 කින් වැඩි වූ අතර, උතුරු ඇමෙරිකාවෙන් පැමිණීම් ද 1989 ට වඩා සියයට 38 කින් වැඩි විය. ලංකා සංචාරක මණ්ඩලයේ මූලයන්ට අනුව 1990 දී සංචාරක කර්මාන්තයෙන් ලද දළ විදේශ විනිමය ඉපැයීම් පසුගිය වර්ෂයට වඩා සියයට 75 (විගැහි අනුව සියයට 49) ක වැඩිවීමක් පෙන්නුම් කරමින්, රුපියල් දශ ලක්ෂ 4,800 (විගැහි දශ ලක්ෂ 88) ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත.

1990 දී සංචාරක කර්මාන්තය මගින් සපයන ලද මුළු රැකියා අවස්ථාවන් 60,000 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මින් 25,000 ක් පමණ සංචාරක කර්මාන්තයේ කෙළින්ම සේවා නියුක්තව සිටින අතර, ඉතිරි 35,000 අනුබද්ධ අංශවල සේවා නියුක්තව ඇත.

ශ්‍රේණිගත නවාතැන් අංශයේ හෝටල් ඒකක සංඛ්‍යාව 1989 දී 118 සිට 1990 දී 120 දක්වා පුළුල් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු කාමර ධාරිතාව 1989 වර්ෂයේ 9,459 සිට 1990 වර්ෂයේ 9,556 දක්වා සියයට එකක ආන්තික වැඩිවීමක් පෙන්විය. මේ අතර ශ්‍රේණිගත නවාතැන් අංශයේ කාමර උපයෝගීකරණ අනුපාතිකය 1989 සියයට 31 සිට 1990 සියයට 47 දක්වා වැඩි විය. අතිරේක නවාතැන් අංශයේ ඒකක සංඛ්‍යාව වර්ෂ දෙක ඇතුළත දී 80 සිට 96 දක්වා සියයට 20 කින් වැඩි විය.

1983 සිට හෝටල් කර්මාන්තය සඳහා රජය විසින් සළසනු ලැබූ සහන වැඩපිළිවෙල 1990 වර්ෂය තුළදී ද තවදුරටත් ක්‍රියාත්මක විය. ණය ආපසු ගෙවීමේදී සියයට 100 ක ණය ප්‍රතිලේඛනගත කිරීමේ අවසරය දික් කිරීම සහ පාඩු ලබන හෝටල්වල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පොළී රහිත ණය පහසුකම් ලබාදීම මෙම පියවරවලට ඇතුළත් විය.

මීට අමතරව 1990 දෙසැම්බර් මස 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත කරන ලද දූනට ක්‍රියාත්මක වන සංචාරක හෝටල්වල වත්කම් පුනරුත්ථාපනය/ප්‍රතිසංස්කරණය සඳහා දෙනු ලබන ණය හා පහසුකම් සඳහා සියළුම වෙළෙඳ බැංකු සහ අනුමත ණය දෙන ආයතනවලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා දෙන ලදී.